**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2018

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

ගිණුම්කරණය පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබූ අතර, 1.1 සිට 1.7 දක්වා උප කොටස් 07 ක් යටතේ වත්කමක ධාරණ අගය ගණනය කිරීම, වෙළෙඳ ලැබිය යුතු මුදල් පාලන ගිණුම, එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම්, දළ ලාභ අනුපාතයන්, ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම් තැබීම, හවුල් ආඥා පනතේ විධි විධාන සහ තොග අගයකිරීම් පිළිබඳ අයදුම්කරුවන් තුළ ඇති දැනුම පරීක්ෂා කිරීම මෙමගින් සිදුකර තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා සෑම අයදුම්කරුවෙකුම උත්තර සපයා තිබූ අතර, එම උත්තර පත්‍ර ඇගයීමේදී පහත සඳහන් දුර්වලතාවයන් ඒ ඒ ප්‍රශ්නවලට අදාලව නිරීක්ෂණය විය.

1.1 ඇතැම් අයදුම්කරුවන්ට වත්කමක සාධාරණ අගය පිළිබඳ අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය වූ අතර, ඒ නිසා ඔවුන්ට එම ප්‍රශ්නයට නිවැරදි උත්තරයක් සැපයීමට අපොහොසත් වී තිබුණි.

1.3 ඇතැම් අයදුම්කරුවන්ට විකුණුම් පිරිවැය, දළ ලාභය සහ විකුණුම් අතර ඇති සම්බන්ධතාවය අවබෝධ කරගැනීමට නොහැකි වී තිබුණි.

1.5 අයකරගත් VAT බදු හා ගෙවන ලද VAT බදු අනුව, VAT පාලන ගිණුමේ ශේෂය ගණනය කිරීමට බොහෝ දෙනෙක් අපොහොසත් වී තිබුණි.

1.6 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ 24 වැනි වගන්තියේ දැක්වෙන විධිවිධාන පිළිබඳ බොහෝ දෙනෙකුට අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මත ඇතැම් අයදුම්කරුවන් වැරදි ලෙස ලාභ ප්‍රාග්ධන අනුපාතයට බෙදාගත යුතු බවට හා හවුල්කරුවන් අමතර යෙදූ ණයමුදල් සඳහා පොලී ගෙවිය යුතු නිවැරදි අනුපාතය 5% ක් ලෙස නොව වෙනත් විවිධ අනුපාතයන් දක්වා තිබීම තුලින් තහවුරු විය.

1.7 බොහෝ දෙනෙකු මෙම කොටසට නිවැරදිව උත්තර සපයා තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් අංක ගණිතමය ක්‍රමයට උත්තර සපයා තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ලැබීම් සහ නිකුත් කිරීමේ වගුව ආධාරයෙන් නිවැරදි උත්තර සපයා තිබුණි. එහෙත් තවත් අයදුම්කරුවන් පිරිසක් අදාල ගණනය කිරීම් තම ගණකයන්ත්‍රය මඟින් ගණනය කර උත්තර පමණක් ඉදිරිපත්කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. මෙවැනි ගණනය කිරීම් වලදී අදාල පියවරයන් දැක්වීම වැදගත් වේ. විෂය නිර්දේශයට අනුකූලව දැනුම වර්ධනය කර ගැනීමෙන් හා අදාල පෙළපොත් පරිශීලනය කිරීමෙන්, තම දැනුම තහවුරු කර ගැනීමෙන් වැඩි ලකුණු ගැනීමට අයදුම්කරුවන් උනන්දු විය යුතුය.

<u>**B කොටස**</u>

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

## ප්‍රශ්න අංක 02

යම් ආයතනයක් වෙත තම බැංකු ගිණුමට අදාලව බැංකු ප්‍රකාශනය ලැබුණු පසු එම බැංකු ප්‍රකාශනයේ ඇතුලත් කරුණු සහ පිළියෙල කරන ලද මුදල් පොතේ තොරතුරු සංසන්දනය කිරීමේදී යම් වෙනස්කමක් වේ නම් එම් වෙනස්කම් මුදල් පොත සංශෝධනය කිරීම මගින් නිවැරදි කර අනතුරුව අදාළ වෙනස්කම් වේ නම් ඒවා බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම මගින් සසඳා පෙන්වීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකස්කර තිබූ අතර, අයදුම්කරුවන්ගෙන් බොහෝ පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව උත්තර සපයා තිබුණි. එසේ වුවද ඇතැම් අයදුම්කරුවන්ට මුදල් පොත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිසි අවබෝධයක් නොතිබූ අතර ඔවුන් විසින් මුදල් පොතේ සංශෝධනය විය යුතු අයිතමයන්ද බැංකු සැසඳුම් ප්‍රකාශයේද බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්විය යුතු අයිතමයන් මුදල් පොතේ දක්වා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. ගලපන ලද මුදල් පොතේ නිවැරදි ශේෂය බැංකු සැසඳුම් ප්‍රකාශනයට ගෙන ඒමද සමහර අයදුම්කරුවන් විසින් සිදුකර නොතිබුණි.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය වැටුප්, දීමනා සහ වැටුපෙන් කරනු ලබන අඩුකිරීම් මෙන්ම එම අඩුකිරීම් බාහිර පාර්ශවයන්ට ගෙවීම් ගිණුම්ගත කිරීම පිළිබඳ වූ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස්කරන ලද්දකි. මේ සඳහා මුළු අයදුම්කරුවන්ගෙන් බහුතරයක් උත්තර සපයා තිබූ අතර, ඉතා සුළු පිරිසකගේ හැරුනුවිට බොහෝ දෙනෙකුට නිවැරදිව උත්තර සැපයීමට නොහැකි වී තිබුණි. මේ නිසා බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

මෙම ප්‍රශ්නය මගින් දී ඇති තොරතුරු ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කරන ලෙස ඉල්ලා තිබුණද ඇතැම් අයදුම්කරුවන් ලෙජර් ගිණුම් ඉදිරිපත් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් මෙම තොරතුරුවලට අදාල වන සෑම ජර්නල් සටහනක්ම ඉදිරිපත් කර නොතිබූ අතර, ඉදිරිපත් කර තිබූ ජර්නල් සටහන් සංලක්ෂ්‍යය ඉදිරිපත් නොකිරීම වැනි විවිධ අඩුපාඩු වලින් යුක්ත බව අනාවරණය විය. තවද ජර්නල් සටහන් ඉදිරිපත් කිරීමේදී මුදල් සටහන්ද ඇතුළුව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද බොහෝ අයදුම්කරුවන් මුදල් සටහන් දක්වා නොතිබුණි. ඇතැම් අය ඉදිරිපත් කර තිබූ ජර්නල් සටහන් අනුව සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය වූ සේව්‍යයා විසින් දායක වනු ලබන 12% ක ප්‍රමාණය සේවකයාගේ වැටුපෙන් කරන ලද අඩුකිරීමක් ලෙස වැරදියට දක්වා තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

ජර්නල් සටහන් ලිවීමේදී සංලක්ෂ්‍යය (narrations) බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ඉදිරිපත් කර නැත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල මූලික වැටුපට අදාලව ගණනය කළ යුතු වුවත්, වැරදි ලෙස එය දළ වැටුපට ගණන් බලා තිබූ අයදුම්කරුවන් ද විය. සමහරු නිවැරදිව ගණනය කර ඇතත්, අදාල ජර්නල් සටහන් නිවැරදිව තැබීමට අපොහොසත්ව ඇත. වැටුප් ලෙජර් පාලන ගිණුමට අදාල ජර්නල් සටහන් ඉදිරිපත් කිරීමේ අවබෝධය සමහර අයදුම්කරුවන්ට නැත. වැටුපෙන් අඩුකිරීම් වැටුප් පාලන ගිණුමෙහි සටහන් තැබීමේ මූලික අවබෝධය ලබාගත යුතුය. අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන උත්තර සැපයීම ඉතා වැදගත්ය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින් ණයගැති සහ ණයහිමි පාලන ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ දැනුම පරීක්ෂා කිරීමේ අරමුණින් සකස්කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් මේ සඳහා සාර්ථකව උත්තර සපයා තිබූ අතර, බොහෝ දෙනෙකු සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. එසේ වුවද ඉතා සුළු පිරිසකට නිවැරදිව උත්තර සැපයීමට නොහැකි වී තිබූ අතර, එම අයදුම්කරුවන් එක් එක් පාලන ගිණුම්වල ආරම්භක සහ අවසාන ශේෂයන් හර සටහන්ද, බැර සටහන්ද යන්න අවබෝධ කර ගැනීමට නොහැකි වීම නිසා ණයහිමි පාලන ගිණුමේ ශේෂය හර ශේෂයක් ලෙසත් ණයගැති පාලන ගිණුමේ ශේෂය බැර ශේෂයක් ලෙස වැරදියට දක්වා තිබුණි. තවද ණයහිමි පාලන ගිණුමේ සටහන් විය යුතු අයිතමයන් ණයගැති පාලන ගිණුමේද ණයගැති පාලන ගිණුමේ සටහන් විය යුතු අයිතමයන් ණයහිමි පාලන ගිණුමේද සටහන් කර තිබූ අවස්ථාද විය. ද්විත්ව සටහන් මූලධර්මය පිළිබඳ අවබෝධය තහවුරු කරගත යුතුය.

## ප්‍රශ්න අංක 05

හවුල් ව්‍යාපාරයක එක් හවුල්කරුවෙකු විශ්‍රාම ගන්නා අවස්ථාවකදී අගය කරන ලද කීර්තිනාමය ගිණුම්ගත කරන ආකාරය සහ එවැනි අවස්ථාවක වත්කමක් ප්‍රත්‍යාගණනය කළවිට එම ප්‍රත්‍යාගණන ලාභය හවුල්කරුවන් අතරේ බෙදාහැරීම ගිණුම්ගත කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය පිළියෙල කර තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණද වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සහ ප්‍රත්‍යාගණන ලාභය හවුල්කරුවන් අතරේ බෙදාහැරීම නිවැරදිව සටහන් කිරීමට අපොහොසත් වී තිබුණි. කීර්තිනාමය ගිණුම්ගත කිරීමේදී කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා නොගැනීම පිළිබඳ නිසි අවබෝධයක් ඇති බවක් නිරීක්ෂණය නොවූ අතර, ඇතැම් අයදුම්කරුවන් කීර්තිනාමය ගිණුම්පොත්වල සටහන් කළද එය ඉවත් කිරීමේ සටහන් යොදා නොතිබුණි. ජර්නල් සටහන් පිළිබඳ අනවබෝධය නිසා ලෙජර් ගිණුම් පෙන්වීමටද සමහර අයදුම්කරුවන් පෙළඹී ඇත.

## ප්‍රශ්න අංක 06

ස්ථාවර වත්කම් විකිණීම සහ පොත්වලින් ඉවත් කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකස්කර තිබූ අතර, වැඩි අයදුම්කරුවන් පිරිසක් මෙයට උත්තර සපයා තිබුණි. ඉන් වැඩි දෙනෙකු (a) කොටසට නිවැරදි උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණද ඇතැම් අයදුම්කරුවන්ට පෙර වර්ෂවලට අදාල ක්ෂයවීම් නිවැරදිව ගණනය කිරීමට නොහැකි වීම නිසා මෝටර් රථ විකිණීමේ ලාභය නිවැරදිව ගණනය කරගත නොහැකිවී තිබුණි. එහෙත් මෙහි (b) කොටසට උත්තර සැපයීමේදී ඇතැම් අයදුම්කරුවන්ට වර්ෂය තුළදී මිලටගත් බෙදාහැරීමේ ට්‍රක් රථයේ ක්ෂය වීම් නිවැරදිව ගණනය කර ගැනීමට අපොහොසත් වීම නිසා ලකුණු අහිමිව ගොස් තිබුණි. මෙහිදී වාහනය මිලදීගත් දිනය හා ගිණුම් වර්ෂයේ අවසන් දිනය පිළිබඳ නිසි අවධානය යොමු නොකර සම්පූර්ණ වර්ෂයටම ක්ෂයකිරීම මෙයට හේතු වී තිබුණි. තවද ඇතැම් අයදුම්කරුවන් විසින් විකුණනලද මෝටර් රථයේ 2016 අප්‍රේල්, මැයි හා ජූනි මාසවලට අදාලව ක්ෂය නිවැරදිව ගණනය කර ඉවත් කිරීමේ ගිණුමට ගෙනගොස් තිබුණද එම ප්‍රමාණය ප්‍රවර්ථන වර්ෂයට අදාල ක්ෂය ලෙස ක්ෂය ගිණුමට ගෙනගොස් නොතිබුණි.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)
(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

ලාභ අරමුණු කර නොගත් සංවිධානවලට අදාලව ගිණුම් තැබීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂා කර තිබුණි. මුළු අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබූ අතර, සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය සඳහා වෙන්කර තිබූ සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත්වී තිබුණි.

සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකි වූ අයදුම්කරුවන්ගේ උත්තරවල පහත සඳහන් වැරදි සහ දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(1) ප්‍රශ්නයේ (a) කොටසින් පිළියෙල කරන ලෙස ඉල්ලා ඇත්තේ අවන්හලේ වෙළෙඳ ගිණුම වුවද ඇතැම් අයදුම්කරුවන් ඒ වෙනුවට පිළියෙල කර ඉදිරිපත් කර තිබුණේ සාමාජික මුදල් ගිණුම්ය.

(2) ක්‍රීඩා සමාජය ලාභ අරමුණකින් තොරව පිහිටුවන ලද ආයතනයක් වුවද, එමගින් පවත්වාගෙන යනු ලබන අවන්හල ලාභ අපේක්ෂාවෙන් පවත්වාගෙන යන බවට බොහෝ දෙනෙකුට අවබෝධයක් නොමැති වීම නිසා අවන්හලට අදාල ගැනුම්, විකුණුම් සහ අවන්හලේ ආරම්භක සහ අවසාන තොගය, ආදායම් වියදම් ගිණුමට ඇතුලත් කර තිබුණි.

(3) ණයහිමි පාලන ගිණුම් සම්බන්ධයෙන් ඇතැම් අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම ඉතාමත් අඩු මට්ටමක පැවති අතර, ඒ හේතුවෙන් අවන්හලේ ගැනුම් නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි. ඇතැම් අයදුම්කරුවන් ගැනුම්වල වටිනාකම සොයාගැනීම සඳහා ණයහිමි ගිණුම් පිළියෙල කිරීමේදී ආරම්භක හා අවසන් ශේෂයන් ගිණුම්වල වැරදි පැත්තේ ඇතුලත්කර තිබීම තුලින් එම අයදුම්කරුවන්ට ණයහිමි ගිණුමක සාමාන්‍යයෙන් පවතින්නේ බැර ශේෂයක් බවට අවබෝධයක් නොමැතිබව නිරීක්ෂණය විය. තවද ඇතැම් අයදුම්කරුවන් ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්වෙන සැපයුම්කරුවන්ට ගෙවන ලද මුදල වන රු.7,200/- ක මුදල ගැනුම් ලෙස දක්වා තිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් වෙළෙඳ ගිණුම නිවැරදිව පිළියෙල කර නිවැරදි ලාභය ගණනයකර තිබුණද එම ලාභය ආදායම් වියදම් ගිණුමට ඇතුලත් කර නොතිබුණි.

(5) උත්තර සපයන ලද සමහර අයදුම්කරුවන් වර්ෂයට අදාල සාමාජික මුදල්, ලිපිද්‍රව්‍ය වියදම් සහ ක්‍රීඩා උපකරණ ක්ෂය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී තිබුණි.

### ප්‍රශ්න අංක 08

කේවලස්වාමි ව්‍යාපාරයක මූල්‍ය දත්ත ආශ්‍රයෙන් ශේෂ පිරික්සුම පිළියෙල කර මෙම ලකුණු 10 ම ලබා ගැනීමට නියමිතව තිබුණි. මුළු ලකුණු ලබාගත් ප්‍රතිශතය අවම මට්ටමක විය. ඇතැම් අයදුම්කරුවන් උත්තර සැපයීමට උත්සාහා කර නැත. ණයහිමි ගිණුම ගැලපීම් කර ගැනුම් සොයා ගැනීමට, විකුණුම් පිරිවැය ගණනය කිරීමට, මුදල් හා බැංකු ශේෂ නිවැරදිව සොයා ගැනීම, ආරම්භක ශේෂ ගලපා නිවැරදි දත්ත ආශ්‍රයෙන් ප්‍රාග්ධනය සොයා ගැනීමට උත්සාහ කළ යුතු වේ.

ද්විත්ව සටහන් න්‍යාය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස්කර ඇති මෙම ප්‍රශ්නය සඳහා බොහෝ දෙනෙකුට සාර්ථකව උත්තර සැපයීමට නොහැකිව තිබුණි. මේ සඳහා උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගේ පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(1) වර්ෂයේ ආරම්භක වත්කම් හා වගකීම් ශේෂයන් උපයෝගී කරගෙන නිවැරදිව ප්‍රාග්ධනය ගණනය කිරීමට බොහෝ දෙනෙකු අසමත්වී තිබුනි.

(2) කාර්යාල උපකරණවල ආරම්භක ශේෂය හා වර්ෂ අවසාන ශේෂය දි ඇති විටෙක හා එම වසර තුළ වත්කම්වල අගය වෙනස්වීමට බලපාන ස්ථාවර වත්කම් එකතු කිරීමක් හෝ අඩු කිරීමක් (addition සහ disposal) සිදුවී නැත්නම් වර්ෂ මුල හා අග ශේෂ අතර, වෙනස එම වසරේ ක්ෂයවීම් ලෙස හඳුනාගත හැකි වුවද බොහොමයක් අයදුම්කරුවන්ට ක්ෂයවීම්වල වටිනාකම හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(3) ණයහිමි ගිණුමේ දත්තයන් උපයෝගී කරගෙන ගැනුම්වල වටිනාකම සොයාගැනීම පිළිබඳව අයදුම්කරුවන්ට ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම නිසා ගැනුම්වල වටිනාකම නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

(4) වර්ෂයට අදාල උපචිත විදුලි වියදම කොපමණද යන්න හඳුනා නොගෙන වර්ෂය තුළ ගෙවන ලද විදුලි වියදම වන රු.13,000/- ක මුදල වර්ෂයට අදාල විදුලි වියදම ලෙස දක්වා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(5) ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමේදී ශේෂ පිරික්සුමේ දැක්වෙන එක් එක් අයිතමයන්ගේ වටිනාකම ගණනය කර ඇති ආකාරය දැක්වෙන පෙරවැඩ උත්තරය සමග ඉදිරිපත් කර නොතිබූ බැවින් ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති වටිනාකම නිවැරදි නොවූ වටෙකදී අදාල පෙරවැඩවල දැක්වෙන සටහන් සඳහා ලකුණු ලබාදිය හැකි වුවත් පෙරවැඩ ඉදිරිපත් නොකිරීම නිසා එම ලකුණු අහිමිව ගොස් තිබුණි. එබැවින් ප්‍රශ්නයට අදාල පෙරවැඩ ඉදිරිපත් කිරීම ලකුණු රැස් කිරීමේදී ඉතා වැදගත් වේ.

(6) ඇතැම් අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ අතර, ශේෂ පිරික්සුම පිළියෙල කළ සමහර අයදුම්කරුවන් හර සටහන් බැර සටහන් මාරුකර ඉදිරිපත් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. මුදල් හා බැංකු ගිණුම් පිළියෙල කර අවසාන ශේෂ ලබා ගැනීම් කර නොතිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක 09

හවුල් ව්‍යාපාර ආයතනයක ව්‍යාපාරික කටයුතුවලින් ලබාගත් ලාභය ප්‍රාග්ධන පොලී, වැටුප් හා ලාභ'ලාභ හවුල්කරුවන් අතරේ බෙදාගන්නා ආකාරය ගිණුම්ගත කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය පිළියෙල කර තිබුණි. මේ සඳහා මුළු ප්‍රශ්නයටම නිවැරදි උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබූ අයදුම්කරුවන් සංඛ්‍යාවෙහි අඩු ප්‍රවණතාවයක් දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගේ පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(1) ඇතැම් අයදුම්කරුවන් විසින් "මනු" නමැති හවුල්කරුට හිමි වාර්ෂික වැටුප වෙනුවට ප්‍රශ්නයේ දී ඇති මාසික වැටුප පමණක් දක්වා තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් සියළුම හවුල්කරුවන් සඳහා වැටුප් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(2) 2016 අප්‍රේල් 01 දිනට **මනුගේ** ජංගම ගිණුමේ ශේෂය බැර ශේෂයක්ද **අනුගේ** ජංගම ගිණුමේ ශේෂය හර ශේෂයක්ද වුවත් එම ශේෂයන් දෙකම බැර ශේෂයන් ලෙස පෙන්වා තිබුණි.

(3) ලාභ කොටස නිවැරදිව ගණනය කිරීමට බොහෝ අයදුම්කරුවන් අසමත්වී තිබුණි. ලාභ'ලාභ බෙදාගැනීමේ අනුපාත නිවැරදිව යොදා නොගැනීමද දක්නට ලැබුණි.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සීමාසහිත සමාගමක කළමනාකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා ආදායම් ප්‍රකාශයත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයත් පිළියෙල කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකස්කර තිබූ අතර, එමගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS) අනුව නියමිත ආකෘතියේ ගිණුම් පිළියෙල කිරීම, ආදායම් බදු ගණනය කිරීම, තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි වටිනාකම අඩුවූ විට ගිණුම් තැබීම, බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන්කිරීම මෙන්ම ක්ෂයවීම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නය මඟින් පරීක්ෂා කරනු ලැබ තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් විය.

මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගෙන් නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු පහත පරිදි විය:

(1) බොහෝ අයදුම්කරුවන් ආදායම් බදු ගැලපීම නිවැරදිව සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. මෙහිදී පසුගිය වර්ෂයට අදාලව ආදායම් බදු අඩි වෙන්කිරීම ගණනය කර ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකිරීමට අපොහොසත් වී තිබුණි.

(2) ඇතැම් අයදුම්කරුවන් වත්කම්වල ක්ෂයවීම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී තිබුණි. වර්ෂයකට අදාල ක්ෂයවීම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගත නොහැකි වීම එයට හේතු වී තිබුණි.

(3) ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී ඇතැම් අයදුම්කරුවන් නිවැරදි ආකෘතියේ ඉදිරිපත් කර නොතිබුණි.

(4) ඇතැම් අයදුම්කරුවන් රඳවාගත් ඉපැයීම් ආරම්භක ශේෂය කෙරෙහි අවධානය යොමු නොකර එය ගැලපීමට උත්සාහ නොගත් අවස්ථා දක්නට ලැබුණි.

(5) වියදම් වර්ගකිරීම පිළිබඳව ඇතැම් අයදුම්කරුවන්ට අවබෝධයක් නොතිබූ අතර, ඔවුන් විසින් බොල් ණය මූල්‍ය වියදමක් ලෙස සළකා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(6) ණයකර සඳහා ගෙවූ පොලිය හා ගෙවිය යුතු පොලිය අනුව වර්ෂයට අදාල මුළු ණයකර පොලී සහ උපචිත ණයකර පොලී නිවැරදිව හඳුනා ගැනීමට ඇතැම් අයදුම්කරුවන්ට නොහැකි වී තිබුණි.

(7) උපචිත සහ කලින් ගෙවූ වියදම් ගැලපුම් විසඳීමේදී ඒ පිළිබඳ මූලික අවබෝධය නොමැති අයදුම්කරුවන්ද දක්නට ලැබුණි.

(8) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අදාල සටහන් නිවැරදි ස්ථානවල හා ආදායම් ප්‍රකාශයට අයදුම්කරුවන්ත් සටහන් නිසි පරිදි ඉදිරිපත් කිරීමට සැලකිලිමත් විය යුතුය. පෙරවැඩ නිවැරදිව කර ආදායම් ප්‍රකාශනයේ අවශ්‍ය අගය නිසි පරිදි පෙන්වූ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත.

(9) කාල කළමනාකරණය සැලකිල්ලට ගෙන අවශ්‍ය ඉල්ලා ඇති තොරතුරු ලබා දීම ලකුණු රැස් කිරීමට හේතු වේ.

**පොදු කරුණු:**

මූලික ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත සමාගම් පනත පිළිබඳ අවබෝධය ලබාගත යුතුය. ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී පිටු වෙන්කර, ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම (ඇතැම් අයදුම්කරුවන් පිටු අංක කිරීම, ප්‍රශ්න අංක ලෙස දක්වයි), උත්තර ආසන්නයෙන්ම අදාල පෙරවැඩ පෙන්වීම හා ප්‍රශ්නයේ කොටස් තැනින් තැන වෙනත් පිටුවල පෙන්වීමෙන් වැළකීම, එසේ පෙන්වීමට සිදුවන අවස්ථාවල සටහනකින් අදාල පිටුවට අවධානය යොමු කරවීම වැදගත් වේ. සෑම විටම දී ඇති උපදෙස් අනුගමනය කර ඒ අනුව උත්තර සැපයිය යුතුය.

\- - -

## අයඳුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණුඃ

1. විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.

2. අයඳුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.

3. උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.

4. අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.

6. අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න ප්‍රත සහ යෝජිත පිළිතුරු උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍රයන් තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.

7. මෙම විෂයට අදාළව ගිණුම්කරණ ප්‍රමිත, ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.

8. කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, පිළිතුරු සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.

9. විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.

\- * * * -